# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2426/74 - 2025 මාර්තු මස 07 වැනි සිකුරාදා - 2025.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ගැසට් පත්‍රය සංශෝධනය

1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත

1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත ප්‍රකාරව 2023 මාර්තු මස 03 වන සිකුරාදා නිකුත් කරන ලද, අංක 2321/70 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 01 (අ) වගන්තිය මෙයින් අවලංගු කොට පහත සඳහන් නව වගන්තිය පනවනු ලැබේ.

සභාවේ අණ පරිදි,

ආචාර්ය ඩබ්. බෝහිංගමුව,
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සභාපති.

2025 මාර්තු මස 07 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

**අධි සාමාජිකයෙකු බඳවා ගැනීම**

01(අ)

අධි සාමාජිකයෙකු ලෙස සභාවට ඇතුළත් කර ගැනීමේ දී වසර පහකට අධික කාලයක් තුළ සභාවේ සාමාජික කාණ්ඩයේ (MSLCA) අඛණ්ඩව සහ සක්‍රීයව සාමාජිකත්වය දරා තිබීම,

සහ

ප්‍රථම උපාධියෙන් පසුව අවම වශයෙන් දස වර්ෂාධික කාලයක් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකු ලෙස කටයුතු කරන ලද අයෙකු වශයෙන් සනාථ කිරීමට හැකි අයෙකු වීම.

EOG 03 - 0095